සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

6 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | 15 S I

නම: ............................................ **ක්‍රිස්තියානි ධර්මය** කාලය පැය දෙකයි

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01) දෙවියන් වහන්සේ සය වන දින මවන ලද්දේ,
1. ගහ කොළ ය. 2. මිනිසා ය. 3. අහස හා පොළොව ය. 4. ඉර හඳ ය.

02) ශාස්ත්‍රවන්තයින් ජේසු බිළිඳා බැලීමට ගෙන යන ලද්දේ,
1. රත්රන්, සුවඳ ලාටු, කට්ටකුමංජල් ය. 2. රතරන්, මැණික්, මුතු ය.
3. රත්රන්, සුවඳලාටු, මැණික් ය. 4. රත්රන්, මැණික්, කට්ටකුමංජල් ය.

03) ජේසු තුමා වයස අවුරුදු 12 දී ජෙරුසලම් දේව මාලිගයට යන ලද්දේ,
1. නත්තල සමරන්නට ය. 2. කූඩාරම් මංගල්‍ය සමරන්නට ය.
3. පාස්කු මංගල්‍ය සමරන්නට ය. 4. පඬිවරු බැහැ දකින්නට ය.

04) "ගොල්ගොතා" යන්න ..................................... භාෂාවේ වචනයකි,
1. ග්‍රීක 2. ලතින් 3. හෙබ්‍රෙව් 4. ඇරමයික්

05) තමා පහත් කර ගනිමින් දෙවිඳුන්ට යාච්ඤා කරන ලද්දේ,
1. පරිස්වරයා ය 2. අයකැමියා ය 3. දිළින්දා ය 4.ලාදුරු රෝගියා ය

- **අංක 06 සිට 10 දක්වා ප්‍රකාශ හරි නම් ( ✔ ) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද යොදන්න.**

06) සෙකරියස් හා එළිසබෙත් තුමියගේ පුත්‍රයා ජොහාන් තුමා ය ( )

07) දෙවියන් වහන්සේට සියල්ල කළ හැකි බව විශ්වාස කිරීම ඇදහිල්ල ය ( )

08) පිලිප් තුමා උපස්ථාදායකයෙකි ( )

09) අපි අන් අයට ගරු නොකළ යුතුය ( )

10) සමාරිය ජාතිකයා වැටුණු මිනිසාට උදව් කරන ලදි ( )

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්න සඳහා A කොටසට ගැළපෙන නිවැරදි පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.**

| A | B |
|---|---|
| 11) ඇදහිල්ලෙන් | • ලාදුරු රෝගීන් දස දෙනා |
| 12) ජේසුස් වහන්සේගේ සුවය ලැබීමට පැමිණියේ ය. | • උත්පත්ති |
| 13) තමා උසස් කර ගන්නා | • ශුද්ධ බයිබලය |
| 14) කිතුනුවාගේ පූජනීය ග්‍රන්ථය | • සුවය ලැබේ |
| 15) පංච පුස්තකයේ ග්‍රන්ථයකි | • පහත් කරනු ලැබේ |

● අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.

16) සමිදාණෝ යහපත් ය, එතුමන්ගේ ...................................................... ස්ථිරය.

17) ............................................... නුඹට නොසිටිය යුතුය.

18) ............................................... මොසෙස් තුමාගේ සොයුරියයි.

19) දාවිත් ............................................... නම් යෝධයා පරාජය කරන ලදි.

20) පංච පුස්තකයට අයත් පොතකි ..........................................................

(මීරියම්, ප්‍රේමය, වෙනත් දෙවි දේවතාවන්, නික්මයාම, ගොලියත්)

## II කොටස

● පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01 කෙටි පිළිතුරු සපයන්න.

i. බිළිඳු ජේසු බැලීමට ආ පුද්ගලයින් දෙදෙනෙකු නම් කරන්න.
ii. "ඒලි ඒලි ලාමා සබක්තානි" මෙහි තේරුම ලියන්න.
iii. පාවිකරයේ දී ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂා 02 ක් ලියන්න.
iv. ජුදා සමාජයේ කොන් වූවන් ලෙස ප්‍රතික්ෂේප කළ ජන කොටස් 02 ක් නම් කරන්න.
v. ශුද්ධ වූ බයිබලය බෙදෙන ප්‍රධාන කොටස් 02 ක නම් කරන්න.
vi. ජේසුස් වහන්සේගේ මව හා පියා නම් කරන්න.
vii. ජේසු උත්ථානයේ සුපුවත සමාජයට රැගෙන ගිය කාන්තාවන් දෙදෙනෙකු නම් කරන්න.
viii. යහපත් කිතුනුවෙකු වීම සඳහා සපුරාලිය යුතු විශේෂ ගුණාංග දෙකක් ලියන්න.

02) i. දෙවියන් වහන්සේ මවන ලද දේවල් 02 ක් ලියන්න.
ii. දේව මැවිල්ල ආරක්ෂා කිරීමට ඔබට කළ හැකි දේවල් 03 ක් ලියන්න.
iii. දෙවියන් වහන්සේ ඔබට ලබා දී ඇති දේවලට තුති පුදමින් යාච්ඤාවක් ලියන්න. (ල.2+3+6=11)

03) i. සාමුවෙල්ගේ මව හා පියා නම් කරන්න.
ii. "සාමුවෙල්" යන නමෙහි අර්ථය ලියන්න.
iii. දෙවියන් වහන්සේ ඔබට කතා කරන ආකාර 03 (තුනක්) ලියන්න. (ල.2 +3+6 =11)

04) i. සුබාරංචි ග්‍රන්ථ 02 ක් නම් කරන්න.
ii. ඔබට දෙවිඳුන් ලබා දී ඇති දීමනා 03 ක් ලියන්න.
iii. ඔබේ සොයුරාට හෝ සොයුරිය වෙනුවෙන් ඔබ කළ හැකි කාර්යයන් 06 ක් ලියන්න. (ල.2+3+6 = 11)

05) i. දාවිත් රජුගේ පියා නම් කර, ඔහුට සිටි පුතුන් ගණන කොපමණ දැයි ලියන්න.
ii. දාවිත් රජු සටනට යාමේ දී රැගෙන ගිය දෑ මොනවාදැයි ලියන්න.
iii. දාවිත් රජුගේ දිවියෙන් ඔබට ලැබෙන ආදර්ශ 06 ක් ලියන්න. (ල.2 +3+6 =11)

06) i. දෙවියන් වහන්සේ මවන ලද මුල් ම යුවළ නම් කරන්න.
ii. දස පනතේ ඔබ දන්නා පනත් 03 ක් ලියන්න.
iii. දෙවියන් වහන්සේගෙන් සමාව ලැබීම සඳහා අප විසින් අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග 03 ක් ලියන්න.
(ල.2+3+6=11)